‡ මෙම (1,795 මුල්සිතියමේ 1,083) බිම්කට්ටියේ තිබෙන ගේ වටිනාකම වෙනුවට එම් ඉඩම විකුණන දවසේ විකුණපු මුදලට රුපියල් 15ක් එකතුකරණු ලැබේ.

§ මෙම (171 අන්තිම සිතියමේ 17$q$) බිම්කට්ටියේ තිබෙන දූවවල වටිනාකම වෙනුවට එම ඉඩම විකුණන දවසේ විකුණපු මුදලට රුපියල් 4.60ක් එකතුකරණු ලැබේ.

‖ මෙම ඉඩම මින් ප්‍රථම මිලේට ගත් නුමුත් එහි වටිනාකම නොගෙවූ නිසා නැවත විකිණීමට ප්‍රසිද්ධකළා ඇත.

1795 මුල්සිතියමේ 1079, 1081, 1082 සහ 1083 බිම්කට්ටි මෙහි පහත සඳහන්වෙන පොරොන්දුපිට විකුණනු ලැබේ :—
(a) ඉඩම මිලේට ගන්න අය ආණ්ඩුව විසින් මින් ඉදිරියට නියමකරණලද දියබද්ද ගෙවන්ට ඕනෑය.
(b) මෙම ඉඩම්වලට දැනට අයකරණ දියබද්ද සැමකාලේටම එකාකාර අයකරවි කියා පොරොන්දුවක් නැත.

මේ ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු උව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1915ක්වූ ජූනි මස 15වෙනි දින කොළඹ මහලේකම්තානීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තානීස් වර්‍යහ.

---

**No. 928, P. of S.**—සබරගමු දිසාවේ කෑගල්ලෙ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1915ක්වූ ජූලි මස 27වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට කෑගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ බෙලිගල්කෝරලේ කොඩාගෙයේ පිහිටා තිබෙන බිම්කැබලි 6ක්.

සිතියම 2,455. ගම—තඹදිය. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම | අක්කරයක මහත. අ. | රූ. | ප. | තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1262 | දුස්වැල්ගාලේහේන .. | අස්මඩලගේ නන්දුවා .. | හේන .. | 1 | 1 | 16 | 30 |
| 1264 | යටපානවත්තේකනටිය .. | — .. | ඉහලගෙදර හේවායලාගේ අබන්චියා සහ තවත් අයෙක් විසින් කුඹුරට අල්ලාගන තිබෙන බිම්කට්ටිය .. | 0 | 0 | 21 | 200* |

සිතියම 2,039. ගම—අඹේපුස්ස.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම | අ. | රූ. | ප. | මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 328 | අලවලයලයහේන .. | ඩී. ජී. ජයවර්ධන .. | හේන .. | 0 | 1 | 22 | 30 |
| 329 | දිගහේන්මූකලාන .. | එම .. | මූකලාන . | 2 | 1 | 22 | 30 |

සිතියම 2,454. ගම—අම්පේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම | අ. | රූ. | ප. | මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1261 | තුරනගොල්ලේමූකලාන .. | ආර්. ඒ. සිඤ්ඤප්පුහාමි ආරච්චිල | මූකලාන .. | 5 | 0 | 18 | 75 |

* බේරීම පිණිස.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අක්කරයක මහත. අ. රූ. ප. | තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|
| | | සිතියම 2,508. ගම—තුම්මුදුන. | | | |
| 1380 | කුඩුම්රිගේහේන | .. යටියන්තොට වත්තේ ජී. ඕ. වුඇල්ඩසින් | .. තේ වගාව | .. 3 2 5 | 100 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ කෑගල්ලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1915ක්වූ ජූනි මස 9වෙනි දින කොළඹ මහලේකම්තැනිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තැනිස් වම්හ.

---

[Cancellation from Sale of Lot No. 162 in Preliminary Plan No. 537, under Sale Notice 3,535, S. O.]

වර්ෂ 1915ක්වූ මැයි මස 27වෙනි දින නිකුත්කරණලද නොම්මර 6,715 දරණ ගැසට්පත්‍රයේ ප්‍රසිඹ කරණලද දකුණු දිසාවේ ලංකාමැනීමේ අංක 537තේ මුල් සිතියමේ පෙනෙන පැද්දපිටිය යන ගමේ ඉඩම් විකිණීම්පත්‍රය මෙයින් අලවංගු කරන්ට යෙදුනා ඇත.

ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණෑවලෙස,

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තැනිස් වම්හ

---

[Cancellation of Land Sales in Kosinna, Pahalakalalpitiya, &c., published in the "Government Gazette" No. 6,709 of April 16, 1915.]

වර්ෂ 1915ක්වූ අප්‍රේල් මස 16 වෙනි දින නිකුත්කරණලද නොම්මර 6,709 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිඹකරණලද කොස්ඉන්න, පහලකලල්පිටිය, ඉහලකලල්පිටිය, පටයල, හෙන්ඩුවාව සහ බෝගමුව යන ගම්වල ඉඩම් විකිණීම් සම්බන්ධ දැන්වීම්පත්‍ර මෙයින් අවලංගුකරන්ට යෙදුනාඇත.

ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණෑවලෙස,

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තැනිස් වම්හ.

---

[Cancellation of Land Sales in Yatalgoda, Busnapahuwa, &c., published in the "Government Gazette" No. 6,710 of April 23, 1915.]

වර්ෂ 1915ක්වූ අප්‍රේල් මස 23වෙනි දින නිකුත්කරණලද නොම්මර 6,710 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිඹකරණලද යටල්ගොඩ, බුස්නාපහුව, පල්ලේමෝරුගම, අඹිබොව, බෝයවලාන, නෑබඩවතුර, කන්දේහේන, ඉහලබුජ්ජමුව සහ පහලබුජ්ජමුව යන ගම්වල ඉඩම් විකිණීම් සම්බන්ධ දැන්වීම් පත්‍ර මෙයින් අවලංගුකරන්ට යෙදුනා ඇත.

ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණෑවලෙස,

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තැනිස් වම්හ.

---

[Cancellation of Land Sales in Kirigollewa, Nelugollewa, &c., published in the "Government Gazette" No. 6,713 of May 14, 1915.]

වර්ෂ 1915ක්වූ මැයි මස 14වෙනි දින නිකුත්කරණලද නොම්මර 6,713 දරණ ගැසට්පත්‍රයේ ප්‍රසිඹකරණලද කිරිගොල්ලෑව, නෙළුගොල්ලෑව, දුනුවත්තේගම, පිහිඹියගොල්ලෑව, කෝන්ගොල්ලෑව, පැද්දගම, මස්සලාව, කෝන්කුඹුක්වැව, තඹලගොල්ලෑව, නෑකතුනුවැව, අළුත්ගම සහ අළුවාකෙටුවල යන ගම්වල ඉඩම් විකිණීම් සම්බන්ධ දැන්වීම්පත්‍ර මෙයින් අවලංගුකරන්ට යෙදුනා ඇත.

ගරුතර උතුමාණන්වහන්සේගේ අණෑවලෙස,

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තැනිස් වම්හ.

---

## LAND ACQUISITION NOTICES.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම්.

[Weragama in Pallesiya Pattu of Matale East.]

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගල්වලක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ ඇරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 6,557. ගම—පල්ලේසියපත්තුවේ වෙරගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| A 58 | ක්‍රිසල්ඹිල්වත්ත | .. රටකහගස් කීපයක් ඇති මුඩුබිම | .. වැන්ස්ටරන් මහතා .. | .. 0 | 2 | 1·12 |
| B 58 | එම | .. මුඩුබිම .. | .. එම .. | ... 0 | 0 | 4 |
| C 58 | ඇදකොස්ගහමුලහේන | .. එම .. | .. එච්. අජ්ජුහාමි .. | .. 0 | 0 | 4·25 |
| D 58 | ක්‍රිසල්ඹිල්වත්ත | .. එම .. | .. වැන්ස්ටරන් මහතා .. | .. 0 | 0 | 12·62 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියෝගකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම හැමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1915ක්වූ ජූලි මස 22වෙනි දින සවස එකේ කනියමට මාතලේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1915ක්වූ ජූනි මස 11 වෙනි දින මාතලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ජේ. ඇල්. රජර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

[Unaveli, Puttalam District.]

වෂී 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—උනවෙලිවැව වැඩි දියුණුව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස වෂී 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මනත්‍රිසභාවේ මනත්‍රණය ඇතුව උතුමානන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 4,364. ගම—උනවෙලි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| M 78 | පීකුලම්තෝටම් .. | පොල්වත්ත .. | ඇම්. වයි. ඇම්. මේයියප්පා සෙට්ටි .. | 1 1 16 |
| N 78 | උනවෙලිකානි .. | එලිකලකැලේ .. | එම .. | 86 3 32 |
| O 78 | උනවෙලිවායල් .. | කුඹුර .. | එම .. | 2 1 13 |
| P 78 | එම .. | එම .. | එම .. | 0 1 36 |
| Q 78 | එම .. | එම .. | එම .. | 1 0 38 |
| R 78 | ඉලුක්කුලන්චේනතෝටම් .. | පොල්වත්ත .. | එම .. | 0 0 6 |
| S 78 | එම .. | එම .. | එම .. | 0 1 30 |
| T 78 | එම .. | එම .. | එම .. | 0 0 8 |
| U 78 | පට්ටන්කුට්ටිචේනතෝටම් | එම .. | එම .. | 3 1 14 |
| | | | | 96 0 33 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි. එනම්;—පුත්තලම්පත්තු කොඨාසයේ පුත්තලම් පත්තුවේ අම්බලවෙලියේ පිහිටා තිබෙන නො. 4,365යේ මුල් සිතියමේ සඳහන් 2149 දරණ මන්චිකට්ටිකුලමකාඩු කියන ඉඩම්කට්ටියට මාරුකර ගැනීම පිණිසයි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වෂී 1915ක්වූ ජූලි මස 6වෙනි දින දවල් 1ක් කනිසමට පුත්තලමේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වෂී 1915ක්වූ ජූනි මස 8වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
ආණ්ඩුවේ උප ඒජන්තතැන වෙනුවට

[Marapona, Ratnapura District.]

වෂී 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—රත්නපුරය සිට පැල්මඩුල්ල දක්වා යන රේල්පාර කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වෂී 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මනත්‍රිසභාවේ මනත්‍රනය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 92. ගම—මාරපොන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 31N4B | බබාගේගොඩැල්ල .. | පොල්වත්ත .. | ඒ. ඕන්ගිරි මහත්මයා සහ තවත් අය .. | 0 0 10·75 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වෂී 1915ක්වූ ජූලි මස 12වෙනි දින පස්වරු 1ක් කනිසමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වෂී 1915ක්වූ ජූනි මස 12වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ආර්. ඇන්. හෝන්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

[Proclamation by Special Commissioner, relating to Firearms.]

ප්‍රකාශපත්‍රයයි.

තුවක්කු පිස්තෝලාදිය.

මෙම මස 10වෙනි දින දරණ ප්‍රකාශපත්‍රයේ 4වෙනි වගන්තියේ ප්‍රකාර කොළඹ නාගරික මායිම තුළ තුවක්කු පිස්තෝලාදිය තියාගෙණ සිටින සියළුදෙනා විසින් කිට්ටුවම තිබෙණ පොලිස් ස්ටේෂමට ඒවා භාරනොදෙණ ලද්දේනම් වහාම ඒවා භාරදෙණමෙන් මෙයින් අණකරමි.

එසේ නොකර සිටින අය හෝ ලයිසන් නොගත් තුවක්කු පිස්තෝලාදිය තියාගෙණ සිටින අය තදබල දඬුවමකට යටහත්වෙනු ලැබේ.

මෙම නියෝගය යුරෝපීය ජනයා අතරේ කිසිවෙකුට හෝ යම් සේවා හමුදාවකට නියමලෙස බැඳී තුවක්කු ආදිය දැරීමට නියමව සිටින කිසිවෙකුට වලංගුනොවේ.

ආඥාපරිද්දෙන්,
ආර්. ඩබ්ලිව්. බර්ඩ්,
විශෙෂ කොමිෂනර්තැන.

වෂී 1915ක්වූ ජූනි මස 16වෙනි දින කොළඹ
නාගරිකසභා කන්තෝරුවේදීය.

[Proclamation by Special Commissioner.]

ප්‍රකාශපත්‍රයයි.

නොබෝද සිදුවුන කෝලාහලය සම්බන්ධව වෙන්ට යෙදුනු කරුණු ගැන හෝ ඊට ආධාරදෙන්ට යෙදුනු කරුණු ගැණ දන්නා දෙයක් දැනුම්දෙන්ට කැමති කෙනෙක් කොළඹ නාගරික සභා කන්තෝරුවේදී සෙනසුරාද දවස් ඇර අනිත් දවස්වලදී දවල් 11ටත් 3ටත් අතරතුරේදී මා දකින්ට පුළුවන.

වෂී 1915ක්වූ ජූනි මස
17වෙනි දිනදීය.

ආර්. ඩබ්ලිව්. බර්ඩ්,
විශෙෂ කොමිෂනර්තැන.

[Tenders for Provisioning Hospitals, Engiriya, Udugoda and Marawila]

1. වර්ෂ 1915ක්වූ ඔක්තෝම්බර් මස 1වෙනි දින පටන් වර්ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මීට යාකර තිබෙන උපලේඛනයේ සඳහන්වෙන ඉස්පිරිතාලවලට කෑම සැපයීමට ටැන්ඩර්ස් භාරගණු ලැබේ.

2. සියලුම ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර් බෝර්ඩ් ප්‍රධානතැන නමට එවියයුතුයි.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර්ස් පෙට්ටියේ දැමිය යුතුයි නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. මුද්‍රකරපු ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ඇන්විලොප් එකේ වම්පැත්තේ ඉහළ "———— ඉස්පිරිතාලයට කෑම සැපයීමට ටැන්ඩරය" යන වාසගම ලියා 1915ක්වූ ජූලි මස 6වෙනි දින දවල් 12ට ප්‍රථම ආදායමේ කොන්ට්‍රෝලර් තුමාගේ කන්තෝරුවට ලැබියයුතුයි. ඉස්පිරිතාලයේ නම ඇන්විලොප් එකේ සටහන්කළ යුතුයි.

5. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යවාර්යතැනගෙන් ලබාගතහැකි ෆෝර්මකොලවල ඉල්ලුම් කළ යුතුයි. නියම ෆෝර්මකොල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්න බව දතයුතුයි. ටැන්ඩර් කඩදාසියේ වැරැද්දක් හරිගැස්සුවිට ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුලකුරු තබන්ට ඕනෑය; එසේ නොකළොත් ඒ ටැන්ඩරය භාරනොගන්ට පුළුවන.

6. ටැන්ඩර් ෆෝර්මකොල ඉල්ලුම්කරන්ට ප්‍රථම මෙහි උපලේඛනයේ සඳහන්කර තිබෙන ප්‍රකාර කච්චේරියක මුදල් බැඳ කුවිතන්සි ගෙනෙන්ට ඕනෑය. යම් අයෙක් ටැන්ඩරය එව්වාසින්පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කිවොත්, එසේ නැතුව ඔහුට ඊට නියම ඇපය දෙන්ට බැරිවුනොත් එම අය විසින් ෆෝර්මකොළ ගනිද්දී බැඳපු මුදල රජසන්තක වෙනවා ඇත. තවද එම අයට ආණ්ඩුවේ කොයිම කොන්ත්‍රාත්එකකට බැඳෙන්ට නුපුළුවන් හැටියට ඔහුගේ නාම ආණ්ඩුවේ කොන්ත්‍රාත්වලට බැඳෙන්ට නුපුළුවන් අයගේ ලැයිස්තුවට ඇතුල්කරනු ලැබේ. කොන්ත්‍රාත්තුව සම්වුනායින් පසු ෆෝර්මකොළ ලබාගැනීමට බැඳපු අයිත්මුදල ආපසු ගෙවනවා ඇත. ප්‍රධාන සිවිල් වෛද්‍යවාර්යතැනගේ කන්තෝරුවේදී ටැන්ඩර් ෆෝර්මවලට මුදල් බාරගනු නොලැබේ.

7. ඕනෑකළොත් භාරගන්ට යෙදුන බඩුවල සැම්පල්ස් දියයුතුයි.

8. බාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් මෙහි පහත පෙනෙනාකාර ඇප තිබා ටැන්ඩරය සමග එවන ඔප්පුව අත්සන්කරන්ට ඕනෑය. ෆෝර්මකොල ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක් මෙන් බාරගනු ලැබේ.

9. ප්‍රධාන සිවිල් වෛද්‍යවාර්යතුමාගේ අවසරය කලින් ලියවිල්ලකින් ලබාගත්තේ නැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අන්කිසිකෙනෙකුට පැවරිය නොහැකිය.

10. ඉහත සඳහන්කරණලද සියලුම වගන්ති ඉෂ්ටනොකරන්නාවූ ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර පිළිනොගන්න බව දතයුතුයි.

11. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් හෝ සම්පූර්ණයෙන්ම අවුරුදු එකකට දෙකකට නොහොත් තුනකට කොටසක් බාරගැනීමට ආණ්ඩුවට බලය තිබේ.

12. වැඩිදුර කාරණ ප්‍රධාන සිවිල් වෛද්‍යවාර්යතැනගෙන් දැනගත හැකිය.

වර්ෂ 1915ක්වූ ජූනි මස 15වෙනි දින කොළඹදීය.

(අත්සන්කළේ), ඩබ්ලිව්. සී. එච්. ප්‍රිජ්, ප්‍රධාන සිවිල් වෛද්‍යවාර්යතැන වෙනුවට.

———

උපලේඛනය.

| ඉස්පිරිතාලේ නම. | සපයන්ට ඕනෑ කෑම විස්තර. | ෆෝර්මකොළ ගන්ට බැඳියයුතු මුදල. රු. | ඇප මුදල රු. |
|---|---|---|---|
| ඉංගිරියෙ ඉස්පිරිතාලය | උයාපුකෑම සහ එලකිරි | 100 | 200 |
| උඩුගොඩ ඉස්පිරිතාලය | එම | 100 | 200 |
| මාරවිල ඉස්පිරිතාලය | එම | 200 | 400 |

---

[Tenders for provisioning Hospitals, Mannarama.]

1. ටැන්ඩර භාරගත් දින පටන් වර්ෂ 1918ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මීට යාකර තිබෙන උපලේඛනයේ සඳහන්වෙන ඉස්පිරිතාලයට කෑම සැපයීමට ටැන්ඩර්ස් භාරගනු ලැබේ.

2. සියලුම ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර්ස් බෝර්ඩ් ප්‍රධානතැන නමට එවිය යුතුයි.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර්ස් පෙට්ටියේ දැමිය යුතුයි; නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. මුද්‍රකරපු ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ඇන්විලොප් එකේ වම්පැත්තේ ඉහළ "———— ඉස්පිරිතාලයට කෑම සැපයීමට ටැන්ඩරය" යන වාසගම ලියා 1915ක්වූ ජූලි මස 6වෙනි දින දවල් 12ට ප්‍රථම ආදායමේ කොන්ට්‍රෝලර් තුමාගේ කන්තෝරුවට ලැබිය යුතුයි. ඉස්පිරිතාලයේ නම ඇන්විලොප් එකේ සටහන්කළ යුතුයි.

5. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යවාර්යතැනගෙන් ලබාගතහැකි ෆෝර්මකොළවල ඉල්ලුම් කළ යුතුයි. නියම ෆෝර්මකොළවල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්න බව දතයුතුයි. ටැන්ඩර් කඩදාසියේ වැරැද්දක් හරිගැස්සුවිට ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුලකුරු තබන්ට ඕනෑය; එසේ නොකළොත් ඒ ටැන්ඩරය භාරනොගන්ට පුළුවන.

6. ටැන්ඩර් ෆෝර්මකොළ ඉල්ලුම්කරන්ට ප්‍රථම මෙහි උපලේඛනයේ සඳහන්කර තිබෙන ප්‍රකාර කච්චේරියක මුදල් බැඳ කුවිතන්සි ගෙනෙන්ට ඕනෑය. යම් අයෙක් ටැන්ඩරය එව්වාසින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කීවොත්, එසේ නැතුව ඔහුට ඊට නියම ඇපය දෙන්ට බැරිවුනොත් එම අය විසින් ෆෝර්මකොළ ගනිද්දී බැඳපු මුදල රජසන්තක වෙනවා ඇත. තවද එම අයට ආණ්ඩුවේ කොයිම කොන්ත්‍රාත් එකකටවත් බැඳෙන්ට නුපුළුවන් හැටියට ඔහුගේ නාම ආණ්ඩුවේ කොන්ත්‍රාත්වලට බැඳෙන්ට නුපුළුවන් අයගේ ලැයිස්තුවට ඇතුළත්කරනු ලැබේ. කොන්ත්‍රාත්තුව සම්වුනායින් පසු ෆෝර්මකොළ ලබාගැනීමට බැඳපු අයිත් මුදල ආපසු ගෙවනවා ඇත. ප්‍රධාන සිවිල් වෛද්‍යවාර්යතැනගේ කන්තෝරුවේදී ටැන්ඩර් ෆෝර්මවලට මුදල් බාරගනු නොලැබේ.

7. ඕනෑකළොත් භාරගන්ට යෙදුන බඩුවල සැම්පල්ස් දියයුතුයි.

8. බාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් මෙහි පහත පෙණෙනාකාර ඇප තිබා ටැන්ඩරය සමග එවන ඔප්පුව අත්සන්කරන්ට ඕනෑය. ෆෝර්මකොළ ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක්මෙන් බාරගනු ලැබේ.

9. ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්‍ය්‍යතුමාගේ අවසරය කලින් ලියවිල්ලකින් ලබාගන්නේ නැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අන්කිසිකෙනෙකුට පැවරිය නොහැකිය.

10. ඉහත සඳහන්කරණලද සියලුම වගන්ති ඉෂ්ටනොකරන්නාවූ ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර පිළිනොගන්නබව දතයුතුයි.

11. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් හෝ සම්පූර්ණයෙන්ම අවුරුදු එකකට දෙකකට නොහොත් තුනකට කොටසක් බාරගැනීමට ආණ්ඩුවට බලය තිබේ.

12. වැඩිදුර කාරණ ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්‍ය්‍යතැනගෙන් දැනගත හැකිය.

වර්ෂ 1915ක්වූ ජූනි මස 9වෙනි
දින කොළඹදීය.

(අත්සන්කළේ), ඩබ්ලිව්. සී. එච්. ට්‍රිප්,
ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්‍ය්‍යතැන වෙනුවට.

උප ලේඛනය.

| ඉස්පිරිතාලේ නම. | සපයන්ට ඕනෑ කෑම විස්තර. | පෝර්මකොළ ගන්ට බැඳියයුතු මුදල. රු. | ඇප මුදල. රු. |
|---|---|---|---|
| මන්නාරමේ ඉස්පිරිතාලය .. | උයාපු කෑම සහ එලකිරි .. | 100 .. | 200 |

[Tender for repairing the Salt Department Officirs' Quarters, Kombumune, Tillayadi, and Pachchakadumundal, Puttalam District.]

"කොම්බුමුනේ, තිල්ලයඩි සහ පච්චකාඩුමුන්දල් යන ලුණු අලම්වල ලුණු දෙපාර්තමේන්තුවේ මුලාදෑනීන්ගේ ගෙවල් අළුත්වැඩියා කිරීමටය" කියා පිට කවරයෙහි සඳහන්කරණලද මුද්‍රකරපු ඉල්ලුම්පත්‍ර පුත්තලමේ ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1915ක්වූ ජූනි මස 29වෙනි දින සවස 1ක වෙනතුරු එම වැඩ කොන්ත්‍රාත්පිට කරන්ට කැමතිවූ ඇත්තන්ගෙන් බාරගනු ලැබේ.

විස්තර ආදියයි.

සියලුම දිරාගිය සහ කැඩිතිබෙන්නාවූ පොල්අතු සහ ලීදඬු අහක්කර ඒවා වෙනුවට අළුත් ඒවා දමන්ට ඕනෑය.

වහලවල් උඩ බර වෙනුවට පුච්චූ ගෙවත් මාංගු දමන්ට ඕනෑය.

වැටවල් අළුත් ඉනිවලින් සහ පොල්අතුවලිනුත් නැවත සාදන්ට ඕනෑය.

ගෙයි බිම අළුත් මැටි දමා උස්කර, සමතලාකර තදකරන්ට ඕනෑය.

මුදප්පේර් හෙවත් පරීක්ෂකතැනගේ ගෙට අළුත් යතුරු තහඩු දෙකක් සහ යතුරුත් දමන්ට ඕනෑය.

මුදප්පේර්ගේ සහ පළමුවෙනි කලෑසියේ කොස්තාපල්ගෙන් ගෙවල්වල බිත්තිවලට සුදු හුණු ගාලා, දොරවල් සහ ජනේල වලටත් තීන්ත ගාන්ට ඕනෑය.

මුදප්පේර්ගේ ගෙදර ස්ටෝරු කාමරේ බස්නාහිර පැත්තේ බිත්තිය කඩාදමා නැවත සාදන්ට ඕනෑය.

බිත්තිවල ඕනෑකරණ තැන් කපලාරුකර අළුත්වැඩියා කරන්ට ඕනෑය.

පළමුවෙනි කලෑසියේ කොස්තාපල්ගේ ගෙදරට යතුරු තහඩුවක් සහ යතුරකුත් සපයන්ට ඕනෑය.

පළමුවෙනි කලෑසියේ කොස්තාපල්ගේ ගෙදරට කක්කුසියක් සාදවා දෙන්ට ඕනෑය.

ඉල්ලුම්කාරයෝ විසින් මින් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ක්‍රියාකරන්ට බැඳෙන්ට ඕනෑය.

1. උපඒජන්ත උන්නාන්සේ විසින් නියමකරණ කාලය තුළදී ඉල්ලුම්කාරයා විසින් කොන්ත්‍රාත්තුවකට බැඳෙන්ට නොයෙදුනොත් රජසන්තකවීම පිණිස වර්ෂ 1915ක්වූ ජූනි මස 28වෙනිදාට හෝ ඊට මත්තෙන් රුපියල් දහයක් ඕනෑම කච්චේරියක බඳින්ට ඕනෑය.

2. ඉල්ලුම්කාරයා විසින් ඔහුට ලියකියමන් ලැබෙන්ට පුළුවන් පුත්තලමේ ස්ථානයක් නියමකළ යුතුයි.

3. අත්තිකාරම් දෙනු නොලැබේ.

4. ඉල්ලුම්පත්‍රය බාරගත්තාය කියා දැනුම්දෙන දින සිට සුමාන හතරක් ඇතුළතදී වැඩයකර ඉවරකරන්ට ඕනෑය.

5. වැඩිදුර කාරණ පුත්තලමේ ලුණු දෙපාර්තමේන්තුවේ ඉන්ස්පැක්ටර්තැනගෙන් දැනගත හැකිය.

අත්සන්කළේ, ඈස්. ඈම්. පී. වැන්ඩර්කෝන්,
ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1915ක්වූ ජූනි මස 10වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

[Tender for Constructing new Quarters for Salt Watcher at Kala oya, Puttalam District.]

"කලාඔයේ ලුණු මුරකාරයාට ඔහු දැනට පදිංචිව ඉන්න ස්ථානයේම අළුතෙන් ගෙයක් සෑදීමටය" කියා පිට කවරයෙහි සඳහන්කරණලද මුද්‍රකරපු ඉල්ලුම්පත්‍ර පුත්තලමේ ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1915ක්වූ ජූනි මස 29වෙනි දින සවස 1ක වෙනතුරු එම වැඩේ කොන්ත්‍රාත්පිට කරන්ට කැමතිවූ ඇත්තන්ගෙන් බාරගනු ලැබේ.

විස්තර ආදියයි.

මෙකී ගෙට අඩි පහළොහක් දිගඇති අඩි දොළහක් පළල් ඇති කාමර දෙකක් තිබියයුතුයි. තවද අඩි 6ක් පළල ඇති ඉස්තෝප්පුගේ ඉස්සරහට සහ පස්සටත් තිබෙන්ට ඕනෑය. ගෙට මැටි බිත්ති සාදන්ට ඕනෑය. වහලවල් පුච්චූ ගෙවත් මාංගුවලින් බැඳ පොල්අතුවලින් සෙවිලිකරන්ට ඕනෑය.

එම ස්ථානයේ තිබුන පරණගෙයි දොරවල් තුනක් සහ ජනේල එකකුත් අළුත්වැඩියාකර අළුතෙන් සාදන්ට යන ගෙයි පාවිච්චියට ගන්ට ඕනෑය.

මෙම ගෙට අල්ලා අඩි දහයක් දිග සහ අඩි දහයක් පළලත් ඇති කුස්සියක් සාදන්ට ඕනෑය. එම කුස්සියට ඉස්සරහ පැත්තේ අඩිහතරක් පළල ඇති ඉස්තෝප්පුවක් තිබෙන්ට ඕනෑය.

ගෙට දොරවල් තුනක් සහ ජනේල එකකුත් තිබෙන්ට ඕනෑය. කුස්සියට එක දොරකුත් එක ජනේලෙකුත් තිබෙන්ට ඕනෑය.

ගෙයි සහ කුස්සියෙත් දොරවල්වලට යතුරු තහඩු හතරක්ද, සරනේරු සහ සොසිබත් ඕනෑකෙරේ.

බිත්ති මැටිවලින් කපුලාරුකර හුනු ගාන්ට ඕනෑය.

ගේබිම මැටිවලින් උස්කර සමතලාකර ගොමගාන්ට ඕනෑය.

පියසි මතුපිට බරවීම පිණිස පුච්චූ ගෙවත් මාංගු දමන්ට ඕනෑය.

ආණ්ඩුවට යම් ගෙවිල්ලක් නොමැතිව ඕනෑකරණ ලීදඬු දික්වන්නවේ මූකලානෙන් කපා ගෙණයන්ට ඕනෑය.

මින් පහත සඳහන්වෙන කොන්දේසිවලට අනුව ක්‍රියාකරණ හැටියට ඉල්ලුම්කාරයෝ බැඳෙන්ට ඕනෑය.

1. උපඒජන්ත උන්නාන්සේ විසින් නියමකරණ කාලය තුළදී ඉල්ලුම්කාරයා විසින් කොන්ත්‍රාත්තුවකට බැඳෙන්ට නොයෙදුනහොත් රජසන්තකවීම පිණිස වර්ෂ 1915ක්වූ ජූනි මස 28වෙනිදාට හෝ ඊට මත්තෙන් රුපියල් 10ක් ඕනෑම කච්චේරියක බඳින්ට ඕනෑය.

2. ඉල්ලුම්කාරයා විසින් ඔහුට ලියකියවිලි ලැබෙන්ට පුළුවන් පුත්තලමේ ස්ථානයක් නියමකළ යුතුයි.

3. අත්තිකාරම් නොදෙනු ලැබේ.

4. ඉල්ලුම්පත්‍රය බාරගත්තාය කියා දැනුන්දෙන දින සිට සුමාන හතරක් ඇතුළතදී වැඩයකර ඉවරකරන්ට ඕනෑය.

5. වැඩිදුර කාරණ පුත්තලමේ ලුණු දෙපාර්තමේන්තුවේ ඉන්ස්පැක්ටර්තුමාගෙන් දැනගත හැකිය.

ඈස්. ඈම්. පී. වැන්ඩර්කෝන්,
ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1915ක්වූ ජූනි මස 11වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

[Tender for Toll Rents, Province of Sabaragamuwa.]

වර්ෂ 1915ක්වූ ඔක්තෝම්බර් මස 1වෙනි දින පටන් වර්ෂ 1916ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මෙහි පහත සඳහන්වෙන සබරගමු පළාතේ රේන්ද මිලේට ගැනීමට එවනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1915ක්වූ ජූලි මස 12වෙනි සඳුදා පස්වරු 1ට රත්නපුරේ කච්චේරියේදී බාරගන්ට යෙදෙන බව මෙසින් දැනුම්දෙමි.

2. (*a*) මෙහි පහත පෙන්නුම්කර තිබෙනාකාරයට එක එක රේන්දයට වෙන්වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවිය යුතුයි.

(*b*) ඉල්ලුම්පත්‍රවල පිටකවරේ නොහොත් "ඇන්විලොප්" එක මතුපිට වම්පැත්තේ උඩකෙරවළේ Tender for Toll Rents කියා සලකුණු කරන්ට ඕනෑවත් ඇර ඉල්ලුම්කරනලද රේන්දේ නම සඳහන්කරන්ටත් ඕනෑය.

3. බාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් සල්ලිවලින් වහාම මෙහි තබන්නට ඕනෑය. එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් බාරගන්නට සෙදුසිනම් ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනෙන් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍රඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

4. ඇප පිණිස තිබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතුවූ ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකෙරීමටද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රිජිස්තර්කෙරීමට ගෙවියයුතුවූ ගාස්තුත් ඔහු විසින් ගෙවන්නට ඕනෑය.

5. ඇප වෙනුවෙන් තිබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍ර ලබාගැනීමට ඕනෑකරන වියදම ඇප තබන අය විසින් දැරිය යුතුයි.

මේ ගැන වැඩිදුර කාරණා ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

රත්නපුර දිස්ත්‍රික්කේ.

1. දෙමුවාන තොටුපල රේන්දය.

2. ඉදන්ගොඩ තොටුපල රේන්දය.—එනම්, කළුගඟේ නැගෙණහිර ගංඉවුරේ අයගම සිට ඉඩන්ගොඩට යන සුළු පාර ඉවරවෙන තැනවූ හැරණියවක තොටුපල.

3. කළුගඟේ නැගෙණහිර ඉවුරේ කැටේපොල සිට කුකුළු කෝරලේ ගවගිරිය දක්වා යන ගම්සහා පාරේ කැටේපොල තොටුපල් රේන්දය.

කෑගල්ල දිස්ත්‍රික්කේ.

1. රුවන්වැල්ලට සහ ඊට නුදුරුව තිබෙන රේන්දපල වල් :—

(1) රුවන්වැල්ලේ කැලණිගඟේ තොටුපල් රේන්දය.

(2) රුවන්වැල්ලට නුදුරුව අඟුරුවැල්ලේ ගුරුගොඩ ඔයේ තොටුපල් රේන්දය.

(මෙසින් එක රේන්දපලකදී රේන්දකාසි ගෙව්වොත් ඒ දවස තුළදී අනිත් රේන්දපලෙන් ගෙවීමෙන් නිදහස්ය.

2. මාපිටිගම රේන්දපල.

සී. ඊ. ජෝන්ස්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1915ක්වූ ජූනි මස 14වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

[Supreme Court Criminal Sessions at Colombo.]

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන අඥාවක බලය කරණකොටගෙන මෙසින් ප්‍රකාශකරන්නේ නම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1915ක්වූ ජූලි මස 12වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අළුත්කඩේහි තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙසින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ඩබ්ලිව්. ඒ. ද ලිවේරා,
දෙ: පිස්කල් වම්හ.

වර්ෂ 1915ක්වූ ජූනි මස 14වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

[Supreme Court Criminal Sessions for Chilaw and Puttalam, at Colombo.]

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන අඥාවක බලය කරණකොටගෙණ මෙසින් ප්‍රකාශකරන්නේනම් හලාවත සහ පුත්තලම් දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1915ක්වූ ජූලි මස 12වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙසින් සෑමදෙනාටම ද වන්නෙමි.

ඇස්. ඞී. සමරසිංහ,
වයඹ දිසාවේ පිස්කල්තැන වෙනුවට.

වර්ෂ 1915ක්වූ ජූනි මස 10වෙනි දින
කුරුනෑගල පිස්කල් කන්තෝරුවේදීය.

[Supreme Court Criminal Sessions for Ratnapura, at Colombo.]

ශ්‍රී ලංකාවීපයේ ගරු කටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන අඥාවක බලය කරණකොට ගෙණ මෙසින් ප්‍රකාශකරන්නේ නම් රත්නපුර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1915ක්වූ ජූලි මස 12වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණී හිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙසින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ආර්. ඇන්. තේන්,
පිස්කල් වම්හ.

වර්ෂ 1915ක්වූ ජූනි මස 8වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

[Certificated Teacher for Girls' School, at Akurala, Galle District.]

දකුණු පළාතේ, ගාල්ලේ වැල්ලබොඩ පත්තුවේ අකුරල ආණ්ඩුවේ ගෑණු පාඨශාලාවට දෙවෙනි පඞක්තියේ සහතිකපත්‍රලත් ගුරුවරියෙකු ඕනෑකර තිබේ.

ආණ්ඩුවේ රාජකාර්‍යයෙහි සිටින්නාවූ අයවළුන් විසින් මිස අන් කිසිවෙකු විසින් ඉල්ලුම් නොකළ යුතුයි. ඉල්ලුම්පත්‍ර යැවියයුතු වන්නේ දකුනු පළාතයේ පාඨශාලා පරීක්ෂකතැන වෙතය.

මේවගට,
ජේ. හාර්වඞ්,
අධ්‍යක්ෂකතැන.

වර්ෂ 1915ක්වූ ජූනි මස 14වෙනි දින
ඉගැන්වීමේ කන්තෝරුවේදීය.

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.